" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / பொது தொலைபேசி / General Telephone - 011 - 2093000

SLSI ISO 9001

SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/07-31/FI/13

ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }

දිනය / திகதி / Date } 2022.07.27

**පාලන චක්‍රලේඛ 08 /2022**

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර කාර්යාලය (බ.ප.)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප.)
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් (පළාත් පාලන/අධ්‍යාපන/සෞඛ්‍ය/ප්‍රවාහන/කෘෂිකර්ම),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/ මුල්‍ය/ඉංජිනේරු/සැලසුම්),
කොමසාරිස් (පළාත් පාලන / පරිවාස හා ළමාරක්ෂක සේවා / නිවාස / ඉඩම් ) දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ (කර්මාන්ත/සමාජ සේවා/කෘෂිකර්ම) දෙපාර්තමේන්තුව
පළාත් ආදායම් කොමසාරිස්,ආදායම් දෙපාර්තමේන්තුව(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),

## බස්නාහිර පළාත් සභාවට අයත් වාහන රක්ෂණය කිරීම

බස්නාහිර පළාත් සභාවට අයත් නිල වාහන හිමි නිලධාරීන් වෙත වෙන්කර ඇති වාහන හැර බස්නාහිර පළාත් සභාව සතු අනෙකුත් සියළු වාහන රක්ෂණය නොකිරීමට පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් 2000.11.23 දින පැවති 34 වන පළාත් අමාත්‍ය මණ්ඩලයේදී ගෙන ඇති තීරණය අනුව ප්‍රධාන ලේකම්ගේ අංක 03/5/2/23 හා 2000.12.18 දිනැති ලිපිය මගින් පළාත් සභාවේ සියළුම ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ආයතන ප්‍රධානීන් වෙත දැනුම් දී තිබුණි.

02. එහෙත් වර්තමානයේදී රක්ෂණාවරයක් නොමැතිව සංචිත වාහන ධාවනයේදී ඇති වන යම් යම් දුෂ්කරතා, රක්ෂණාවරණයක් නොමැති වාහන අනතුරට භාජනය වීමේදී ඒවා අළුත්වැඩියා සඳහා පළාත් සභාවට දැරීමට සිදුවන වැය බර සහ පළාත් සභාව සතු වාහනයක් ධාවනයේදී තුන්වන පාර්ශවයකට සිදුවන හානිය සම්බන්ධයෙන් නිසි අධිකරණයක් විසින් තීරණය කල යුතු ප්‍රතිපූරණ වගකීම සම්බන්ධව ගරු නීතිපති තුමා විසින් ලබා දී ඇති නිර්දේශයද සැළකිල්ලට ගෙන පළාත් සභාව සතු සියළුම වාහන සඳහා සමූහ රක්ෂණාවරණයක් ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/03/09/13-v සහ 2022.07.19 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.

03. ඒ අනුව ඔබ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, ආයතනය යටතේ ඇති සියළු වාහන සඳහා පූර්ණ රක්ෂණාවරණයක් සහිත සමූහ රක්ෂණාවරණයක් ලබා ගැනීම සඳහා "Provision of General Insurance Cover for the Government Institution" මැයෙන් මගේ අංක CSWP/FIN-AP/03/FI/01 හා 2019.10.18 දිනැති මුල්‍ය චක්‍රලේඛ 11/2019 හා එම චක්‍රලේඛය මගින් බස්නාහිර පළාත් සභාවට අදාළ කරගෙන ඇති භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කර ඇති 2019.08.15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 06/2019 හා 2019.09.2 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 06/2019 (1) (ඇමුණුම 01, 02 හා 03) මගින් ලබා දී ඇති උපදෙස් පරිදි අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදු කර එම රක්ෂණාවරණය ලබා ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. එමෙන්ම මගේ අංක CSWP/FIN-AP/03/FI/18 හා 2019.03.01 දිනැති මූල්‍ය චක්‍රලේඛ 03/2019 මගින් බස්නාහිර පළාත් සභාවට අදාළ කරගෙන ඇති භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2018.12.31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 ප්‍රකාරව ඔබ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන වල වාහන මේ වන විට තක්සේරු කිරීම සිදු කර අවසන්ව තිබිය යුතු අතර එම තක්සේරු වටිනාකම් පදනම් කර ගනිමින් අදාළ රක්ෂණාවරණය සඳහා මිල ගණන් කැඳවීම සිදු කල යුතු බව කාරුණිකව දන්වමි.

05. යම් හෙයකින් අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් රක්ෂණාවරණය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තෝරාගනු ලබන්නේ නම් මගේ අංක 1/පා/4/14/IV හා 2013.08.01 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති පරිදි බස්නාහිර පළාත් සභාව නමින් ලබා ගෙන ඇති නියෝජිත අංක 78853 යටතේ පමණක් රක්ෂණාවරණය ලබා ගැනීම සිදු කල යුතු බව කාරුණිකව දන්වමි. (ඇමුණුම 05) එමෙන්ම අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් මේ සම්බන්ධව ඔබ යටතේ ඇති සියළු ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමටද කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ඇමුණුම 01


" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු"
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / General Telephone 011 - 2093000
ISO/IEC: 17021 QMS-001-01


මගේ අංකය / My No. CSWP/FIN-AP/03/FI/01 — ඔබේ අංකය / Your No. — දිනය / Date 2019.10.18

## මූල්‍ය චක්‍රලේඛ 11/2019

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

23 OCT 2019
ADM/30

## Provision of General Insurance Cover for the Government Institutions.

"Provision of General Insurance Cover for the Government Institutions" යන මැයෙන් යුතුව භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කර ඇති 2019.08.15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 06/2019 සහ 2019.09.12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 06/2019(1) හා බැඳේ. (එම චක්‍රලේඛයන්හි පිටපත් මේ සමග අමුණා එවමි.)

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/03/2019 හා 2019.10.02, 2019.10.15 දිනැති ලිපි මගින් ඉහත සඳහන් චක්‍රලේඛයන් බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් එම චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. එමෙන්ම මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද 2015.12.11 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 14/2015 මෙමඟින් අවලංගු කරන අතර, මෙම චක්‍රලේඛය මගින් සංශෝධිත විධිවිධාන මෙදින සිට ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම්.
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

ඇමුණුම 03

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PFD/ITIT/INCM/pro
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.09.12

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 06/2019 (i)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපනආයතන ප්‍රධානීන් සහ රජයට අයත් සමාගම්වල සභාපතිවරුන්

<u>රාජ්‍ය ආයතන සඳහා සාමාන්‍ය රක්ෂණාවරණ ලබා ගැනීම</u>

යථෝක්ත කරුණට අදාළව නිකුත් කරන ලද 2019.08.15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 06/2019 හි 02 වන ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

ඡේදය - 2

"ඒ අනුව, රාජ්‍ය ආයතනවලට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) යටතේ ලියාපදිංචිව සිටින රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින්, ඔවුන්ගේ නියෝජිතයන්/ තැරැව්කරුවන් මගින් තරඟකාරි මිල ගණන් කැඳවීම යටතේ සාමාන්‍ය රක්ෂණාවරණ ලබා ගත හැක. රක්ෂණ සේවා ලබා ගැනීමේදී අනෙකුත් කරුණු අතර, අදාළ පිරිවැය, ආවරණය කරනු ලබන අවදානමේ ස්වභාවය සහ සේවාවේ ගුණාත්මකභාවය මෙන්ම ආයතනයට මෙම සේවාව ලබා ගැනීමේ පහසුව යන කරුණු ද ආයතන ප්‍රධානීන් විසින් සලකා බැලිය යුතුය. තවද, මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා රක්ෂණ සේවා සම්පාදකයින් හට ප්‍රමාණවත් කාල සීමාවක් ලබා දිය යුතුය."

2019.08.15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 06/2019 හි ඇතුළත් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වේ.

අත් කළේ / ආර්. එච්. එස්. සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. අධ්‍යක්ෂ ජනරාල්, IRCSL: බලපත්‍රය අත්හිටුවීම දැනුම් දීම සඳහා
6. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

දිනුම 03

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PFD/ITIT/INCM/pro
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.08.15

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. 06/2019

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන් සහ
රජයට අයත් සමාගම්වල සභාපතිවරුන්

**<u>රාජ්‍ය ආයතන සඳහා සාමාන්‍ය රක්ෂණාවරණ ලබා ගැනීම</u>**

රක්ෂණ වෙළෙඳපොළ සඳහා රට තුළ වඩාත් තරඟකාරී හා සාධාරණ පසුබිමක් ස්ථාපිත කරමින්, රාජ්‍ය ආයතන විසින් රජය සතු රක්ෂණ සමාගම් වෙතින් පමණක් රක්ෂණ සේවා ලබා ගත යුතු බවට සීමා කරමින් නිකුත් කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2015 හි දැක්වෙන චක්‍රලේඛ උපදෙස් මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

02. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) යටතේ ලියාපදිංචිව සිටින රක්ෂණ වෙළඳපොල තුළ ක්‍රියාත්මකව පවතින රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින් පමණක් තරඟකාරී මිල ගණන් කැඳවීම යටතේ රක්ෂණ නියෝජිතයන්ගේ/ තැරැව්කරුවන්ගේ සේවය ලබාගැනීමකින් තොරව සාමාන්‍ය රක්ෂණාවරණ සෘජුවම ලබා ගත හැකිය. රක්ෂණ සේවා ලබා ගැනීමේදී අනෙකුත් කරුණු අතර, අදාළ පිරිවැය, ආවරණය කරනු ලබන අවදානමේ ස්වභාවය සහ සේවාවේ ගුණාත්මකභාවය මෙන්ම ආයතනයට මෙම සේවාව ලබා ගැනීමේ පහසුව යන කරුණු ද ආයතන ප්‍රධානීන් විසින් සලකා බැලිය යුතුය. තවද, මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා රක්ෂණ සේවා සම්පාදකයින් හට ප්‍රමාණවත් කාල සීමාවක් ලබා දිය යුතුය.

03. තවද, කිසියම් රක්ෂණ සේවා සම්පාදකයෙකු සමඟ ගණුදෙනු කිරීමට පෙරාතුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කොට අදාළ රක්ෂණ සමාගමේ විශ්වසනීයත්වය හා ශක්‍යතාව විමසා බැලීම යෝග්‍ය වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන අත්හිටුවීමේ නිවේදන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියට අමතරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ද පළ කරනු ලැබේ.

04. උක්ත විෂය සම්බන්ධයෙන් වන, අංක 04/2015 හා 2015/07/14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මෙමගින් අවලංගු කරනු ලබන අතර මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2019/08/19 දින සිට බලාත්මක වනු ඇත.

05. www.treasury.gov.lk යන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් මෙම චක්‍රලේඛය බාගත කළ හැකි වේ. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දුරකථන අංක 011-2484614 මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ලබා ගත හැක.

අත්සන / අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

අත්සන / ආර්. එච්. එස්. සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්